# දේශාභිමානී

# ශ්‍රී ලංකා යුද්ධ හමුදා නිත්‍ය බල හමුදාව වෙත නිලධාරියෙකු ලෙස [උපාධි පාඨමාලාව යටතේ] සේවයට එක්වීමට

# ඔබටත් අවස්ථාවක්















## මූලික සුදුසුකම්

| | |
|---|---|
| ■ පුරවැසිභාවය | : ශ්‍රී ලාංකික පිරිමි පුරවැසියෙකු විය යුතුයි. |
| ■ විවාහක/අවිවාහක බව | : අවිවාහක. |
| ■ වයස | : 2025 මාර්තු මස 31 වන දිනට වයස අවුරුදු 18 ත් 24ත් අතර විය යුතුයි. |
| ■ උස | : අඩි 5 යි අඟල් 6 ට (167.5 cm) නොඅඩු විය යුතුයි. |
| ■ බර | : කි.ග්‍රෑ. 52 (රාත්තල් 118) ට නොඅඩු විය යුතුයි. |
| ■ පපුව | : අඟල් 32 ට නොඅඩු විය යුතුයි. |
| ■ දෘෂ්ටි තීක්ෂණත්වය | : 6/6 විය යුතුය (උපැස් සහ කාච රහිතව). |
| ■ ශරීර ස්කන්ධ දර්ශකය | : 18.5 $Kg/m^2$ - 25 $Kg/m^2$ අතර විය යුතුය. |

## අධ්‍යාපන සුදුසුකම්

■ අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් තෙවරකට නොවැඩි වාර ගණනකදී එකවර විෂයයන් තුනක් (03) සමත්වීම (සාමාන්‍ය සාමාර්ථ), සාමාන්‍ය පොදු පරීක්ෂණය සඳහා 30% ක ලකුණු ප්‍රතිශතයක් ලබා තිබීම හා විශ්වවිද්‍යාල ප්‍රවේශය 'Yes' ලෙස සඳහන්ව තිබීම

සහ

■ අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී එකවර විෂයයන් පහකට (05) සම්මාන සාමාර්ථ සමඟ විෂයයන් අටක් (08) සමත්වීම හා තෙවරකට නොවැඩි වාර ගණනකදී ඉංග්‍රීසි, ගණිතය, විද්‍යාව හා සිංහල/දෙමළ විෂයයන් සඳහා සම්මාන සාමාර්ථ ලබා තිබීම හෝ ඉංග්‍රීසි භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථ (S) පමණක් ලබා ඇති අයදුම්කරුවන් අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථ (C) ලබා තිබීම හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් NVQ Level - 4 මට්ටමේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අධ්‍යාපන ආයතනයක් මගින් ඩිප්ලෝමා/උපාධි පාඨමාලාවක් හදාරා තිබීම (NVQ සහතික පත්‍රය ඉදිරිපත් කළ යුතුය)

හෝ

■ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පිළිගනු ලබන අ.පො.ස (සා/පෙළ) හා අ.පො.ස (උ/පෙළ) විභාග වලට සමාන ජාත්‍යන්තර විභාගයකින් (Pearson Edexcel, GCSE, GCE හා Cambridge හෝ වෙනත්) ඒ හා සමාන සාමාර්ථ ලබා තිබිය යුතුය (ඉහත අනිවාර්යය විෂයයන් ද ඇතුළුව).

■ ඉහත සුදුසුකම් සපුරා ඇති හා 2024 වර්ෂයට අදාල අ.පො.ස (උ/පෙළ) විභාග ප්‍රතිඵල අපේක්ෂාවෙන් සිටින අයවළුන්ටද මේ සඳහා අයදුම් කළ හැක.

## වෙනත් සුදුසුකම්

■ ජාත්‍යන්තර/ජාතික/පළාත්/දිස්ත්‍රික් මට්ටමින් ක්‍රීඩා, නායකත්ව, වෙනත් ජයග්‍රහණ සහ වෙනත් භාෂා (සිංහල හා ඉංග්‍රීසි හැර) හැසිරවීම විශේෂ සුදුසුකම් ලෙස සලකා බලනු ලැබේ.

## වැටුප් හා දීමනා සහ අනෙකුත් ප්‍රතිලාභ

■ පුහුණු කාලසීමාව සඳහා කෙඩෙට් නිලධාරීන් හට ආහාර සහ අනෙකුත් දීමනා ද ඇතුළත්ව මාසික දළ වැටුප රු. 91,551.80

■ කෙඩෙට් නිලධාරීන් හට ප්‍රවාහන, නිළ ඇඳුම්, වෛද්‍ය ප්‍රතිකාර සහ නවාතැන් පහසුකම් නොමිලේ සපයනු ලැබේ.

■ පාඨමාලාව සාර්ථකව අවසන් කරනු ලබන කෙඩෙට් නිලධාරීන් දෙවන ලුතිනන් නිලයෙන් අධිකාරියට පත්කරනු ලැබේ.

■ එක්සත් ජාතීන්ගේ සාමසාධක හමුදා මෙහෙයුම්, විදේශීය යුද්ධ හමුදා විද්‍යාපීඨයන්හි පුහුණුවීම්/සංචාර සහ උසස් විදේශ පාඨමාලා හැදෑරීමේ අවස්ථාවන්ද හිමිවේ.



නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු අතර, යුද්ධ හමුදා වෙබ් පිටුව වෙත පිවිසීමෙන් අයදුම්පත බාගත කළ හැක.

විමසීම් :
0112 514 605

අයදුම්පත් භාරගන්නා අවසාන දිනය :
2025 මාර්තු 31

සියළුම විස්තර හා අයදුම්පත් :
www.army.lk/officers

**පිරිස් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය**
ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය,
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,
අකුරේගොඩ පාර,
බත්තරමුල්ල.

tamilguru.lk